# චර්යා ධර්ම සංග්‍රහය

*"අප සෑම කෙනෙකු ම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය යුක්ති සාරධර්ම අනුව ජීවත් විය යුතු යි"*[1]

පුද්ගලයන් සහ නායකයින් වශයෙන්, අපගේ හැසිරීම් MenEngage Alliance හි මූලධර්ම සහ මෙහෙවර පිළිබිඹු කළ යුතු ය. මෙම චර්යාධර්ම සංග්‍රහය, මූලික ප්‍රතිපත්ති සහ වගවීමේ ප්‍රමිතීන් හා එක් ව අපගේ වගවීමේ රාමුවේ අනිවාර්ය අංගයක් බවට පත් වේ. මෙම චර්යාධර්ම සංග්‍රහය පුද්ගල හැසිරීම් කෙරෙහි අවධානය යොමු කරන අතර මූලික මූලධර්ම සහ වගවීමේ ප්‍රමිතීන් අපගේ හවුල් විශ්වාසයන්, අපගේ වගවීමේ පද්ධති සහ පරිචයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි.

මෙම චර්යාධර්ම සංග්‍රහය ප්‍රාදේශීය, ජාතික, කලාපීය සහ ගෝලීය මට්ටමින් MenEngage සන්ධානයේ සාමාජිකයින් තුළ පවතින වටිනාකම් පිළිබිඹු කරන අතර , අඳුරේ අතපත ගෑම සහ වැරදි වීම සිදුවිය හැකි බව හඳුනා ගනිමින් දිගින් දිගට ම අප විසින් ඉගෙනීම තුල ජීවත් වියයුතු බව පෙන්වා දෙයි.

එය රට, කලාපීය සහ ගෝලීය ජාල මට්ටමින් MenEngage Alliance හි සියලු ම සාමාජිකයින්ට අදාළ වේ. MenEngage සන්ධානයට ගෝලීය මණ්ඩලයක් සහ ගෝලීය ලේකම් කාර්යාලයක් ඇත. මෙම ඕනෑ ම ආයතනයකට අයත් පුද්ගලයින් සීමාවාසික පුහුණුලාභීන් සහ උපදේශකයින්ද ඇතුලුව මෙම චර්යාධර්ම සංග්‍රහයට අත්සන් කර පිළිපැදිය යුතු ය.

## සාමාජිකයින් විසින් පිළිපැදිය යුතු යැයි අපේක්ෂා කෙරෙන ගුණ ධර්ම සහ හැසිරීම්

### 1. ගෞරවය සහ කරුණාව

අපි එකිනෙකාට ගෞරව කරමින්, සැලකිල්ලක් දක්වමින්, කාරුණික වන අතර ම අනෙක් අය අපිට සලකනවාට අපි කැමති ආකාරයට අපි අනිත් අයටත් සලකන්නෙමු. වඩා වැදගත් වන්නේ අපගේ ක්‍රියාවන්හි අභිප්‍රායන් නොව, ඒවා දැනෙන සහ අත්විඳින ආකාරය කෙරෙහි ඒවායේ බලපෑම බව අපි තේරුම් ගනිමු. අපි අන් අයට සවන් දෙන්නේ ඔවුන් පවසන තේරුම් ගැනීමට සහ සංවේදනය සඳහා ය. අපි එකඟ නොවන විට පවා ඔවුන්ගේ ඉදිරිදර්ශන අගය කරමු.

අප සමඟ ගැටුමක් ඇති අය වෙත අපි සෘජු ව හා ගෞරවාන්විත ව හෝ නිර්මාණාත්මක ආකාරයකින් ප්‍රශ්නය විසඳීමේ ප්‍රවේශයක් ලබා ගන්නෙමු. අපි අන් අයගේ ශක්තීන් අගය කිරීමට සහ අන් අයගේ සීමාවන් පිළිගැනීමට උත්සාහ කරන්නෙමු. අපි ප්‍රයෝජනවත් ප්‍රතිපෝෂණ සැපයීම සහ වැරදිවලින් ඉගෙනීමේ අවස්ථාවන් සාදාගැනීමට උත්සාහ කරමු.

[1] Delhi Declaration and Call to Action (2014), MenEngage Alliance

අන් අය සමග අපගේ සබඳතාවල දී පැවතිය හැකි අසමාන බලය ගැන අපි සැලකිලිමත් වෙමු. එම වෙනස්කම්වලින් ප්‍රයෝජන නොගැනීමට අපි කැපවන අතර සමතුලිත වූ බලයක් සහිත සබඳතා ඇති කර ගැනීමට උත්සාහ කරන්නෙමු.

මනුෂ්‍යයන් වශයෙන් එකිනෙකාට දක්වන ගෞරවයෙන් ඔබ්බට, අනෙකුත් සතුන්, ශාක, වාතය, ජලය, පස සහ ඛනිජ වැනි අපි ද කොටස්කරුවන් වන ලෝකවාසී ප්‍රජාවන්ට ගරු කිරීමට අපි කැප වෙමුඃ

## 2. ස්ථිර කැමැත්ත

අන් අය සමග අන්තර් ක්‍රියා කරන විට අපි ඔවුන්ගේ ස්ථිර කැමැත්ත සහතික කරන්නෙමු. බලයේ විවිධත්වය හේතුවෙන් ඇතැම් විට කැමැත්ත නොසලකා හැරිය හැකි බව අපි සිහි තබා ගන්නෙමු. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පහළ අධිකාරිය හෝ තත්ත්වය හෝ සම්පත් නොමැතිකම නිසාවෙන් අඩු බලයක් ඇති පුද්ගලයින් හෝ කණ්ඩායමක් විසින් ගන්නා නිදහස් තීරණ වැළැක්විය හැකි ය.

අප අන් අයගේ පෞද්ගලිකත්වයට ගරු කරන අතර පැහැදිලි අවසරයකින් තොර ව අන් අයගේ පුද්ගලික තොරතුරු හෙළි නොකරන්නෙමු.

ලිංගික සහ වෙනත් ඕනෑ ම සමීප සබඳතාවක දී, අනෙක් පාර්ශ්වය නිදහසේ සහ ස්වේච්ඡාවෙන් එකඟ වන බව තහවුරු කර ගැනීමට හා ස්ථිර කැමැත්තට ලබා ගැනීමට අපි බැඳී සිටිමු. ඕනෑ ම මොහොතක තම කැමැත්ත අවලංගු කිරීමට මිනිසුන්ට අයිතියක් ඇති බව අපි දන්නෙමු. යම් පුද්ගලයෙක් මත් වී, සිහිසුන් ව, යම් තීරණයක ප්‍රතිවිපාක තේරුම් ගත නොහැකි අන්දමේ මානසික ආබාධයකින් පෙළෙන්නේ නම් හෝ දරුවෙකු නම් ඔවුනට පැහැදිලි කැමැත්ත ලබා දිය නොහැකි බව අපි දනිමු.[2]

## 3. සාධාරණත්වය සහ සමානාත්මතාවය

අපි අන් අයට සාධාරණ ව හා සමාන ව සලකන්නෙමු. පුද්ගලයින්ට හිමි මනුෂ්‍යත්වය, අයිතිවාසිකම් සහ අභිමානය ප්‍රතික්ෂේප කරමින් අනුන් පහත් හෝ උසස් ලෙස සැලකීමට අපව පොලඹවන පීඩාකාරී ධුරාවලියට අපි විරුද්ධ වෙන්නෙමු.

අපි අප දෙස සහ අන් අය දෙස අපි බලන ආකාරය පිළිබඳ අප තුළ ඇති අවිඥානික පක්ෂග්‍රාහී මත වෙනස් කරගැනීමට උත්සාහ කරන්නෙමු. අන් අයගේ හැසිරීම් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය , ජාතිය, ජාතිකත්වය, ලිංගිකත්වය යනාදිය නිරූපනය කිරීමක් නොව ඔවුන්ගේ පෞද්ගලිකත්වය පිළිබිඹු කිරීම ලෙස දැකීම අපගේ අරමුණ යි.

[2] The MenEngage Safeguarding Children and Young People Policy defines children as anyone at or below the age of 18 years.

සියලු දෙනාට ම සාධාරණ ලෙස අවස්ථා සහ ප්‍රතිලාභ ලබා දීමට අපි උත්සාහ කරන්නෙමු. අන්තර්කරණය වූ, සහයෝගීතාවය සහිත සහ සියලු දෙනා පිළිගන්නා ආකාරයේ පරිසරයක් අපි පෝෂණය කරන්නෙමු. MenEngage සන්ධානයේ, අපගේ ජාලවල සහ අපගේ සංවිධානවල පුද්ගලයන්ගේ තත්ත්වය කුමක් වුවත් ඒවා නොසලකා ඔවුන් සමඟ සම්බන්ධ වීමට වීමට අපි උත්සාහ කරන්නෙමු.

## 4. සදාචාරාත්මක තීරණ ගැනීම

අපි අපගේ තීරණ ගන්නේ මිනිසුන්ගේ සහ පෘථිවියේ යහපතට මිස පුද්ගලික වාසි මත නොවේ. අපගේ තීරණ අපගේ සාමූහික කාර්යයන්ට සහ මෙහෙවරට බලපායි. අපගේ තීරණ මනුෂ්‍ය නොවන ප්‍රජාවන් ද ඇතුළුව විවිධ ආකාරයේ පීඩනයන් සහ කොන්කිරීම්වලට ලක්වන ප්‍රජාවන්ට බලපාන බව අපි දනිමු.

සදාචාරාත්මකව ආචාරධර්ම බිඳවැටෙන අවස්ථාවන්ට මුහුණ දෙන විට, අපි අන් අය, අපගේ සගයන් සහ නායකයින් සහ අනෙකුත් අදාළ ස්ත්‍රීවාදී නායකයින් සහ ප්‍රවීණයන්ගෙන් ඒ පිළිබඳ මත විමසීමක් කරන්නෙමු.

අපගේ ලෝකය සහ අපගේ අරමුදල් රැකබලා ගැනීම සඳහා අපගේ සම්පත් කාර්යක්ෂම ව භාවිත කිරීමට අපි උත්සාහ කරන්නෙමු. අපි රහස්‍ය තොරතුරු ඉතා වැදගත් ලෙස සලකන අතර ඒවා වගකීම් සහගත ව ආරක්ෂා කරන්නෙමු.

## 5. විනිවිදභාවය සහ අවංකභාවය

අපි අන් අය සමඟ කෙරෙන අපගේ සන්නිවේදනයේ අවංකභාවයට කැප වෙන්නෙමු. අපගේ සැලසුම්, අභිප්‍රායන් සහ තීරණ පිළිබඳ ව විනිවිදභාවයෙන් සිටීමට අපි කැප වෙමු. හැකි සෑම විට ම, අපි අපගේ අරමුදල්වල මූලාශ්‍ර, වාර්ෂික අයවැය සහ වියදම් ප්‍රසිද්ධියට පත් කරන්නෙමු.

MenEngage Alliance ජාලය සහ අපගේ සංවිධාන පිළිබඳ නිවැරදි තොරතුරු බෙදා ගැනීමට අපි උත්සාහ කරන්නෙමු. අපි අපේ වැරදි හඳුනාගෙන අන් අයට දොස් නොකියන්නෙමු. අපි යම් දෙයකට කැප වෙනවා නම් ඒ අපි එය පිළිබඳ විශ්වාස කරන නිසාවෙනි.

නුදුරේ දී ඇති විය හැකි විෂමාචාර, කලහකාරී හෝ ගැටලු සහගත හැසිරීම් පිළිබඳ අප සද්භාවයෙන් යුතු ව පැමිණිලි සිදු කරනු ලබන අතර, කිසිවිටෙක අන් අයට එරෙහි ව අසත්‍ය චෝදනා ඉදිරිපත් නොකරමු. ඊට මැදිහත් වූ සියල්ලන්ට ම සාධාරණ හා සාධාරණ ක්‍රියාවලියක් ලබා ගැනීම වෙනුවෙන් අපි පෙනී සිටින්නෙමු.

ගැටුමක් දක්වා දුරදිග යා හැකි අවස්ථාවල දී අවශ්‍ය නම් අපි ප්‍රමාදයකින් තොර ව අදාළ පුද්ගලයින්ට ඒ පිළිබඳ හෙළිදරව් කරන්නෙමු.

## 6. ස්වයං ආවර්ජනය සහ වර්ධනය

අපගේ ක්‍රියාවන් පිළිබඳව ස්වයං-විවේචනාත්මක වීමට, අපගේ සබඳතා සහ තීරණ ඇගයීමට සහ වැරදි සාකච්ඡා කිරීමට සහ ඒවායින් ඉගෙන ගැනීමට විවෘත ව සිටීමට අපි අපේක්ෂා කරන්නෙමු. අපි අන් අය අපට ලබා දෙන ප්‍රතිපෝෂණ පිළිගනිමින් ඒවාට සවන් දී ඒ අනුව ක්‍රියා කරන්නෙමු.

පිරිමින් සහ පිරිමි ළමයින් සමග අපගේ වැඩ කටයුතුවල දී අපි පුරුෂමූලික බලය සහ වරප්‍රසාද පිළිබඳ විවේචනාත්මක ස්වයං- ආවර්ජනයක් ප්‍රවර්ධනය කරන බැවින්, අප අපගෙන් ද එය ම අපේක්ෂා කළ යුතු ය. අපගේ ස්ව-අභ්‍යන්තර ගනුදෙනු වර්ධනය වෙනුවෙන් සිදුකරන කටයුතු අපව අන් අය වෙත ළඟා වීමට සහ පුරුෂාධිපත්‍යයට අභියෝග කිරීමට පදනම සපයයි.

නව බුද්ධියට සහ වර්ධනයට අවශ්‍ය අවකාශය නිර්මාණය කිරීම සඳහා ස්වයං-ආවර්ජනය පුද්ගල සහ සාමූහික රැකවරණයට සම්බන්ධ වේ.

## 7. ඉහළ සහයෝගීත්වය

වරදක් දුටු විට හෝ සැක කරන විට, අපි එය නොදැක්කා සේ නොසිටිමු. ඒවායින් මිනිසුන්ට හානියක් විය හැකි බවත් නිශ්ශබ්දතාවය ද අනුබල දීමක් බවත් අපි දනිමු. හානිකර ආයතනික භාවිතයන් හෝ තනි පුද්ගල ක්‍රියාවන් සම්බන්ධයෙන් අපට ගැටලු තිබිය හැකි වුව ද, අපට එම වැරදි ක්‍රියාවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයා (හෝ පුද්ගලයින්) සමඟ සාකච්ඡා කළ හැකි වන අතර ම එය වළක්වාගැනීම සඳහා එවැනි ක්‍රියාවක යෙදී සිටින පුද්ගලයා කෙරෙහි මැදිහත් විය හැකි යි.

විකල්පයක් ලෙස, බලපෑමට ලක් වූ පුද්ගලයා කැමැති නම්, අපට අදාළ ආයතනයට/අධිකාරියට ගැටලුව සන්නිවේදනය කළ හැකි ය. අප්‍රසාදය ඉස්මතු කිරීම යුක්තිය සහ වගවීම ප්‍රවර්ධනය කිරීමේ මෙන් ම විපත පත් වූවන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීමට ද මඟකි.

### MenEngage සාමාජිකයින් නිරත නොවිය යුතු හැසිරීම්

**1) අපවාදාත්මක හැසිරීම්**

බිය ගැන්වීම, රළු, අකැමැති, ප්‍රහාරාත්මක, අවමන් සහගත සහ අන්‍යයන්ගේ අභිමානයට සහ ස්වාධිපත්‍යයට අගෞරව කරන ආකාරයේ ඕනෑ ම හානිකර හැසිරීමක් මෙයට ඇතුළත් වේ.

හිරිහැර කිරීම, අශිෂ්ට බව, දැඩි කෝපය, වාචික සහ ශාරීරික හිංසනය සහ පළිගැනීම අපවාදාත්මක හැසිරීම් සඳහා උදාහරණ වේ. පහත්කොට සලකන අන්දමේ ආකල්ප, ඔවුන්ගේ මතවාද නොසලකා හැරීම, අගෞරවනීය ඉඟි හා ඉරියව්, ඕපාදූප කීම සහ දරුණු විවේචන වැනි සියුම් ආකාරවලින් ද ඒවා ප්‍රදර්ශනය විය හැකි ය.

## 2) ලිංගික හිරිහැර, අපයෝජනය සහ සූරාකෑම

ලිංගික හිරිහැර, ලිංගික අපයෝජන සහ ලිංගික සූරාකෑම තුළ දැකිය හැකි පොදු දෙයක් වන්නේ, පාර්ශව දෙකක් හෝ වැඩි ගණනක් අතර බල අසමතුලිතතාවයන් හේතුවෙන් බලය අනිසි ලෙස භාවිත කිරීම ක්‍රියාත්මක වීම අතර, ඒවා කැමැත්ත නොමැතිකමට දායක විය හැකි සේ ම එය උග්‍ර කළ හැකි ය.

ලිංගික හිරිහැර සිදු වන්නේ කැමැත්ත නැති ව සිදුවන ලිංගික ඇරයුම්, ලිංගික අනුග්‍රහය සඳහා වන ඉල්ලීම් සහ ලිංගික ස්වභාවයේ වෙනත් වාචික හෝ ශාරීරික හිරිහැරයන් ය. පුද්ගලයෙකුගේ ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගික දිශානතිය, ලිංගික අනන්‍යතාව සහ/හෝ ප්‍රකාශනය පිළිබඳ අපහාසාත්මක ප්‍රකාශ ද ලිංගික හිරිහැරයකි. ලිංගික හිරිහැරවලට කාන්තාවන්ට හෝ වෙනස් කොට සැලකීම සඳහා ඉලක්ක කරගත් වෙනත් පුද්ගලයින්ට වටා ගොඩ නැගෙන මිත්‍රශීලී නොවන රැකියා පරිසරයන් ද ඇතුළත් වේ. හානිකර රූප සහ වෙනස් කොට සැලකීමේ අපහාසත්මක විහිළු හෝ ප්‍රකාශ අපවාදාත්මක සහ අගෞරවනීය වේ.

*(වැඩි විස්තර සඳහා, MenEngage Sexual Harassment Policy and Safeguarding Children and Young People Policy බලන්න.)*

## 3) වෙනස්කොට සැලකීම්

වෙනස් කොට සැලකීම යනු ඔවුන්ගේ ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවය සහ/හෝ ප්‍රකාශනය, ලිංගික දිශානතිය, ජාතිකත්වය, වයස, ආගම, ආබාධිතබව හෝ වෙනත් ඕනෑ ම ලක්ෂණයක් මත මිනිසුන්ට ඍණාත්මක ව සැලකීමයි. එය ජාතිවාදී, ලිංගික, සමලිංගික, විජාතික සහ පන්තිවාදී හැසිරීම් හෝ භාෂාවෙන් හරහා ප්‍රකාශ විය හැකි ය.

අගතීන් මත පදනම් ව පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට එරෙහි ව ප්‍රතිපත්ති සහ ආයතනික තීරණ ගැනීම ද වෙනස් කොට සැලකීමේ අවස්ථාවලට උදාහරණ වේ. යම් පසුබිම් හෝ ගති ලක්ෂණ ඇති අය වෙත අනුග්‍රහය දැක්වීම සහ කොන් වූ ප්‍රජාවන්ගෙන් එන අය බැහැර කිරීම ද තවත් ආකාරයක වෙනස්කොට සැලකීමක් වේ.

## 4) ආයතනික අරමුණුවලට පටහැනි වීම

මෙය පුද්ගලික අවශ්‍යතාවන් අප සංවිධානයේ, ජාලයේ හෝ MenEngage Alliance හි අවශ්‍යතා සමඟ ගැටෙන (හෝ ගැටුම් ඇති විය හැකි) තත්වයන් වෙත යොමු කරයි. ඒවා සාමූහිකයේ අවශ්‍යතාවලට බලපාන නිශ්චිත සාමාජිකයින්ට හෝ ඔවුන්ගේ පවුලේ අයට හෝ මිතුරන්ට ප්‍රයෝජනවත් වන අන්දමේ තීරණ හෝ ක්‍රියා වේ.

MenEngage හි නාමයෙන් හෝ වියදමින් සාමාජිකයෙකුට හෝ කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට ඔහුගේ හෝ ඇයට, මිතුරන්ට හෝ සබඳතාවලට හෝ සාමාජික සංවිධානයකට පුද්ගලික ප්‍රතිලාභයක් ලබා ගත හැකි

තත්වයකට මුහුණ දෙන්නේ නම්, එය ආයතනික අරමුණුවලට පටහැනි වීමට ඉඩක් පෑදිය හැකි බැවින් එයින් වැළකී සිටිය යුතු යි.

*(වැඩි විස්තර සඳහා, MenEngage Conflict of Interest Policy බලන්න.)*

### 5) වංචා දූෂණ

වංචනික හෝ දූෂිත හැසිරීම් හරහා බලය අනිසි ලෙස භාවිත කිරීම හෝ සංවිධානයක් තුළ ඇති තනතුර, පුද්ගලික වාසි සඳහා දත්ත, සම්පත් සහ සේවාවන් වෙත ප්‍රවේශ වීමට ඉඩ ලබා දේ. පුද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා තමන් තුළ ඇති බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම ද මෙයට ඇතුළත් ය.

MenEngage Global Alliance වෙනුවෙන් හෝ MenEngage ජාලයකට හෝ සාමාජික සංවිධානයකට සම්බන්ධ හෝ රාජකාරි ඉටු කරන ඕනෑ ම පුද්ගලයෙක් මෙම හැසිරීම්වලින් වැළකිය යුතු ය.

*(වැඩි විස්තර සඳහා, MenEngage Corruption-Fraud Prevention Policy බලන්න')*

### 6) මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම

මද්‍යසාර හෝ වෙනත් මත් ද්‍රව්‍ය භාවිත කිරීමේ ගැටලු සහගත රටාවක් තිබීම ස්වයං-හානිකරයක් වන අතර අන් අයට හානියක් විය හැක. MenEngage Alliance සාමාජිකයෙකුට ද්‍රව්‍ය භාවිතයේ අක්‍රමිකතාවක් ඇතිවීමේ අවදානමක් තිබේ නම්,  වහාම වෘත්තීය උපකාර ලබා ගැනීමට අපි ඔවුන්ව දිරිමත් කරන්නෙමු.

සාමාජිකයන් මත්පැන් හෝ වෙනත් මත්ද්‍රව්‍යවල බලපෑම යටතේ රාජකාරිවල නිරත නොවිය යුතු ය. ඔවුන් මත්පැන් පානය කරන විට හොඳ විනිශ්චයක් සහිත ව භාවිත කළ යුතු අතර අන් අයට තර්ජනයක් හෝ අගෞරවයක් දැනෙන ආකාරයෙන්, අන් අයගේ ආරක්ෂාව අනතුරේ හෙළන ආකාරයෙන් හෝ නීතිය කඩ කරන ආකාරයෙන් කිසිවිටෙක මත්පැන් පානය නොකළ යුතු ය.

## ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස්

සාමාජිකයින් විසින් මෙම ලේඛනය සහ අදාළ ප්‍රතිපත්ති කියවා තේරුම්ගෙන අත්සන් අපේක්ෂිත ය. මෙම කැපවීම් පිළිබිඹු කිරීමට සහ එකිනෙකාට සහයෝගය දැක්වීමට සන්ධානය විසින් ඉගෙනුම් අවකාශයන් පිරිනමනු ලැබේ. ඕනෑ ම අයෙකුට මෙම චර්යාධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි කළ හැකි ය. සන්ධානයේ සියලු ම නායකයින්ට අමතරව, ගැටලු ඉදිරිපත් කිරීම සඳහා කලාපීය ජාලයේ කේන්ද්‍රස්ථානයක් ද ඇති අතර නිර්නාමික ක්ෂණික ඇමතුම් අංකයක් ද ඇත. වැඩිදුර මග පෙන්වීම සඳහා අපගෙ Reporting a Concern පිටුව බලන්න.

මෙම ආචාරධර්ම සංග්‍රහයේ කඩවීම් සිදු වූ විට දී ප්‍රතිස්ථාපන ප්‍රවේශයන් හෝ විනය ක්‍රියාමාර්ග ලෙස ගත හැකි නිවැරදි කිරීම් ගනු ලැබේ. රටේ නීතියට අනුව සිවිල් සහ දණ්ඩනීය වගකීම් පිළිබඳ වෙනත් ක්‍රියාමාර්ග ද ගත හැකි ය.

*Global Board of MenEngage Alliance විසින් වසරේ/මාසය/දින අනුමත කර ඇත.*